# ඍග් වෛදික සමාජය පිළිබඳ අධ්‍යයනයක්

**කරඬගොල්ලේ සෝහිත හිමි**

## හැඳින්වීම

වෛදිකාර්යයන්ගේ සිත විවිධ ඉසව් ඔස්සේ ක්‍රියාත්මක වූ ආකාරය මෙන්ම ඔවුන්ගේ සභ්‍යත්වය, සංස්කෘතිය, ආචාර ධර්ම හා ආගමික පුද සිරිත් ආදී නොයෙකුත් ලක්ෂණ පිළිබඳව හා තත්කාලීන තොරතුරු අද්‍යතන යුගය හමුවේ පිළිබිඹු කරන සාහිත්‍යාත්මක කැඩපතක් වශයෙන් වේද සාහිත්‍යය පිළිබඳව සිහිපත් කළ හැකිය. වේද සාහිත්‍යයේ ප්‍රමුඛයා වශයෙන් පිළිගැනෙනුයේ ඍග්වේදයයි. මණ්ඩල දහයකින් හා සූක්ත එක්දහස් විසි අටකින් පරිමිත එම සුවිශේෂී ආගමික ග්‍රන්ථය පුරා සඳහන් වී ඇත්තේ වෛදිකාර්යයන් සොබාදහම තුළ තමා දුටු දෙව් දේවතාවුන් කෙරෙහි අපමණ ගරු බුහුමන් පෙරදැරිව ඔවුන් වෙනුවෙන් ස්තුති ගීතිකා ගැයූ ආකාරයයි. එසේම විවිධ පුදපූජා පැවැත්වූ ආකාරයයි. කෙසේ වෙතත් ඍග්වේදය නැමති සාහිත්‍ය මූලාශ්‍රය මූලික කරගනිමින් ඉන්දු ආර්යයන්ගේ තොරතුරු නිරීක්ෂණයේ නිරත වන පශ්චාත්කාලීන පෙර'පර දෙදිග පඬිවරුන්ට එය මහඟු



තෝතැන්නක් වූවාට සැකයක් නැත. එකල ජනයාගේ සාමාජික තොරතුරු දැන ගැනීම සඳහා ඓතිහාසික මූලාශ්‍රයක් වශයෙන් නිතැතින් ඍග්වේදය මහෝපකාරී වෙයි.

## ඍග්වේදය

ආර්යයන්ගේ භාරතීයාගමනයත් සමඟ වසර දහස් ගණනක් පුරාවට සිදු වූ විවිධ මානව ක්‍රියාකාරකම්වලින් හටගත් අග්‍රතම ඵලයක් වශයෙන් වේදය හෙවත් වෛදික සාහිත්‍යය නම් කළ හැකිය. ඍග්, යජුර්, සාමන් හා අථර්වන් යන චතුර්වේදයන් ප්‍රමුඛකොට බ්‍රාහ්මණ, ආරණ්‍යක හා උපනිෂද් යන සාහිත්‍යයන්ගෙන් ද සමූපේත වන වෛදික සාහිත්‍යය වේදකාලීන මානවයාගේ සිතුම් පැතුම් ගති පැවතුම් හා සමාජ රටාවන් ඉතා සියුම්ව හා තත්ත්වානුරූපීව වර්තමානයට ගෙනහැර දැක්වීමට සමත් වෙයි.

''වේද'' යන්නෙහි අර්ථය නම් දැනුමයි. ඒද උතුම් දැනුමයි. එනම් පූජනීය ආගමික දැනුමයි. 'වේද ශබ්දය **විද් ඥානේ, විද් සත්තායං, විද් ලෘ ලාභෙ, විද් විචරණේ,** යන සතර ධාතුන්ගෙන් නිපන්නක් කොට ආචාර්යවරු අර්ථකථන දක්වති. **විදන්ති ජානන්ති, විද්‍යන්තේ භවන්ති වින්දන්ති අථවා වින්දන්තේ ලභන්තේ, වින්දන්ති විචාරයන්ති සර්වේ මනුෂ්‍යාඃ සත්‍යවිද්‍යාං යෛර්යෙෂු වා තතා විද්වාංශශ්ච භවන්ති තේ වේදාඃ** යනුවෙන් හැඳින්වෙන පරිදි හැම මිනිස්සු සත්‍ය ඥානය යමෙකින් දනිත් ද ලබත් ද විචාරණය කෙරෙත් ද යමෙක්හි විදවත්හු වෙත් ද ඒ සතර ශාස්ත්‍රයෝ වේද නම්

වෙතියි ඔවුහු කියත්.[1] මෙහිලා **වේද** යනුවෙන් හඳුන්වනු ලබන්නේ උක්ත **ඍග්, යජුර්, සාමන් හා අථර්වන්** යන වේද ග්‍රන්ථ සතරයි. කෝරාන් යන පදයෙන් අදහස් කැරෙන්නාසේ තනි සාහිත්‍යය කෘතියක් ඉන් අදහස් නො කෙරේ. බයිබල් (උතුම් පොත) යන වචනයෙන් මෙන් නොහොත් බෞද්ධයන්ගේ බයිබලය ලෙස සලකන ත්‍රිපිටකය යන වචනය මෙන් හෝ එක්තරා කාලයකදී සම්පාදනය කරන ලද පොත් රැසෙක සම්පූර්ණ එකතුවක්ද නොවේ.[2] "ප්‍රත්‍යක්ෂයෙන් හෝ අනුමානයෙන් දැනගත නොහැකි සත්‍ය පදාර්ථය මෙයින් දතහැකි නිසා වේදයට වේදයයි කියති."[3] යනුවෙන් වේද ග්‍රන්ථ සඳහා ටීකා රචනා කළ සායනාචාර්යවරයා මේ පිළිබඳ සිය මතය පළ කර ඇත. ඒ අනුව වේදය යනු ශත වර්ෂ ගණනාවක් පුරා අඛණ්ඩව ගොඩනැඟුණු පරම්පරා සියදහස් ගණනක් විවිධ අයුරින් ආරක්ෂා කරමින් හා සංවර්ධනය කරමින් අවිච්ඡින්නව පැවතගෙන එන ලද පූජනීය ඥානසම්භාරයකි.

සමස්ත වෛදික සාහිත්‍යය අතුරෙන් ප්‍රමුඛත්වයෙහිලා සලකනුයේ චතුර්වේදයයි. එම චතුර්වේදය අතරිනුත් ඍග්වේදය මූලිකත්වයෙහිලා කථා කරනු ලැබේ. එය ප්‍රථම වේදකෘතිය වශයෙන් සැලකීම හා ඉන්දු ආර්ය මනුෂ්‍ය වර්ගයාගේ භාෂාව සහ සභ්‍යත්වය පිළිබඳව නිසි අවබෝධයක් තත් ග්‍රන්ථය පරිශීලනය කිරීමෙන් ලබාගැනීමට හැකිවීමත් ඊට හේතු වශයෙන් සඳහන් වේ. "ඍච්" (ඍක් > ඍච් > ඍග්) හෙවත් ස්තුති ගීතිකාවන්ගෙන් සමාහිත වන බැවින්ම මෙය



**ඍග්වේදය** යනුවෙන් නම් කර ඇති අතර බ්‍රහ්මන් විසින් මනුෂ්‍ය ලෝකය තුළ යාග පූජාව බිහිකිරීමේ අදහසින් මෙම ඍග්වේදය නිර්මාණය කරන ලද බව මනුස්මෘතියේ සඳහන් වෙයි. වෛදික සාහිත්‍යය පිළිබඳ විවේචනයක් ඉදිරිපත් කරන ජර්මන් ජාතික වින්ටර්නිට්ස් පඬිවරයා "භාරත දේශවාසීන්ගේ සිත ක්‍රියා කළ ආකාරය පමණක් නොව ඉන්දු යුරෝපීය නමින් හඳුන්වනු ලබන කල්පිත භාෂාව ව්‍යවහාර කළ මනුෂ්‍ය සමූහයා පිළිබඳවත් තත්ත්වාවබෝධයක් ලබා ගැනීමට ද ඍග්වේදය මහෝපකාරී වේ."[4] යනුවෙන් සඳහන් කරයි. ඒ අනුව ඍග්වේදය යථානුරූපීව විවේචනය කර බැලීමෙන් තත්කාලීන ආර්ය භාෂාව, සාහිත්‍යය, ජනාවාසකරණය, ආගමික විශ්වාස, පුදපූජා, සිරිත් විරිත්, සමාජය යනාදී අංශ රාශියක් පිළිබඳව තොරතුරු එකිනෙක වෙන්කර ගත හැකිය.

ඒකකර්තෘක හෝ ඒකකාලීන කෘතියක් වශයෙන් නොසලකන ඍග්වේදයේ ග්‍රන්ථව්‍යුහය ඉතා සංවිධානාත්මක වූවක් යැයි සිතිය හැකිය. විවිධ වේදගීතිකා අඩංගු වන සූක්ත 1028කින් සමන්විත වන මණ්ඩල දහයකින් පරිමිත ඍග්වේදය ඍෂිකුල කිහිපයක මූලිකත්වයෙන් රචනා වී ඇත. ඍග්වේදයේ එන සමස්ත ගීතිකා ප්‍රමාණය මණ්ඩල හා සූක්ත වශයෙන් ව්‍යුහගත වීමටද ප්‍රබලව බලපාන්නට ඇත්තේ එය රචනයට විවිධ ඍෂිකුලයන් මූලික වීම විය හැකිය. ඒ අනුව දෙවැන්නේ සිට හත්වැන්න දක්වා ඇති මණ්ඩලයන් ගෘත්සමද, විශ්වාමිත්‍ර, වාමදේව, අත්‍රි, භාරද්වාජ, වශිෂ්ඨ යන ඍෂිවරුන් හා ඔවුනට අයත් ශිෂ්‍ය ගණයා විසින් රචනා

කරනු ලැබ ඇත. අටවැනි මණ්ඩලය කණ්ව හා අංගීරස යන ඍෂිකුල දෙක ප්‍රධාන ඔවුන්ගේ ශිෂ්‍ය පරම්පරාවන් විසින් රචනා කර ඇති අතර පළමුවන හා දසවන මණ්ඩල අනෙකුත් මණ්ඩලවලට වඩා මෑතකාලීන බවකින් යුක්ත බව ද සඳහන් වෙයි.

| | |
|---|---|
| **පළමුවැනි මණ්ඩලයේ සූක්ත** | 191 |
| **දෙවැනි මණ්ඩලයේ සූක්ත** | 43 |
| **තෙවැනි මණ්ඩලයේ සූක්ත** | 62 |
| **සිව්වැනි මණ්ඩලයේ සූක්ත** | 58 |
| **පස්වැනි මණ්ඩලයේ සූක්ත** | 87 |
| **සයවැනි මණ්ඩලයේ සූක්ත** | 75 |
| **සත්වැනි මණ්ඩලයේ සූක්ත** | 104 |
| **අටවැනි මණ්ඩලයේ සූක්ත** | 114 |
| **නවවැනි මණ්ඩලයේ සූක්ත** | 114 |
| **දසවැනි මණ්ඩලයේ සූක්ත** | 191 |
| **සියලු සූක්ත ගණන** | 1028 |

විවිධ ඍෂිකුලවල එන තොරතුරුවලට අනුව ඍග් වෛදික සූක්ත ප්‍රමාණයේ යම් යම් සුළු සංඛ්‍යාත්මක වෙනස්කම් දක්නට ලැබේ. මෙම එක් එක් මණ්ඩලයන් රචිත ඍෂිකුලයන් විසින් වාචනාමාර්ගයෙන් දීර්ඝ කාලයක් තිස්සේ තම තමන් රචිත ඍග් වෛදික මණ්ඩල ආරක්ෂා කරගනිමින් පාරම්පරිකව පවත්වාගෙන එනු ලැබූ අතර කාලයාගේ ඇවෑමෙන් ඒවා ග්‍රන්ථාරූඪ තත්ත්වයට පත්ව ඇත. "ඍග්වේද සංහිතා" යන ව්‍යවහාරය මේ වෙනුවෙන් ඇරඹී ඇත්තේ එතැන් පටන්ය. මේ එක් එක් ගීතිකාවල සඳහන් වන එක අකුරකුදු නොවෙනස් වන අයුරින් ආරක්ෂාකාරීව



පවත්වාගෙන යෑමේ දැඩි උවමනාවෙන් ඒ ඒ ඍෂිකුල විසින් **ක්‍රමපාඨ, පදපාඨ, මාලාපාඨ, ලේඛාපාඨ, ශිඛාපාඨ, ධ්වජපාඨ, දණ්ඩපාඨ හා රථපාඨ** යැයි තවත් ක්‍රම අටක්ද වේදගීතිකා රචනා කිරීමේදී භාවිත කර ඇත.

**ඍච්** හෙවත් ස්තුති ගීතිකාවලියක එකතුවක් වශයෙන් ඍග්වේදය රචනා වී ඇති බව මීට ඉහතින් ද සඳහන් කරන ලදී. එම ස්තුති ගීතිකා රචනා කිරීමේ මූලික පරමාර්ථය බවට පත්ව වී ඇත්තේ එකල මිනිසුන් විසින් විශ්වාස කරන ලද පරිසරය තුළ දෘශ්‍යමාන හෝ අදෘශ්‍යමාන ස්වාභාවික වස්තු හා විවිධ පාරිසරික සංසිද්ධීන්ට සම්බන්ධ දෙවිවරුන් හට ස්වකීය ස්තුතිය ඉතා බැගෑපත් අයුරින් ප්‍රකාශකර සිටීමටයි. සමස්ත ඍග් වෛදික ගීතිකාවන්ගෙන් වැඩි ප්‍රමාණයක් වෙන් වී ඇත්තේ ඒ අරමුණ මුදුන්පත් කරගැනීමේ බලාපොරොත්තුවෙනි. ඒ අනුව ඍග්වේදාගත විවිධ සූක්තාන්තර්ගත ගීතිකාවලින් තත්කාලීන ජන සමාජයේ ආගමික විශ්වාස පිළිබඳව යථානුරූපී ප්‍රතිබිම්බයක් ලබාදෙන බව සුපැහැදිලි වෙයි. ඒ අනුව චතුර්වේදයන්ගේ ප්‍රමුඛයා වන ඍග්වේදය විශාල ව්‍යාප්තියකින් යුතුව ශත වර්ෂාධික කාලයක් පුරා භාරතීය ජන සමාජයේ විවිධ ඉසව් සංස්පර්ශනය කරමින් හා ඒ ඔස්සේ සංවර්ධනය වෙමින් මානව වර්ගයාගේ ඓතිහාසික ප්‍රවෘත්තියේ එක් විශාල පැතිකඩක් මැනවින් නිරූපණය කරනු ලබන ග්‍රන්ථාවලියක් වශයෙන් සැලකීම වඩාත් උචිතය.

විශේෂයෙන් මෙහිලා ඍග්වේදයේ කාලය පිළිබඳව දැන සිටීම ද උචිත වෙයි. ඍග්වේදයේ කාලය පිළිබඳ ඉතා

උසස් උගතුන් පවා දරන මතයන් සියවස් කිහිපයක කාලය අතින් නොව අවුරුදු දහස් ගණනක කාලය අතින් වෙනස්වීම ඉතා කණගාටුවෙන් නමුත් පිළිගැනීමට සිදුවී ඇති සත්‍යයකි. ඇතැම් උගතුන් වේද සූක්තයන්ගේ පැරණිම කාලය වශයෙන් ක්‍රි.පූ. 1000 වර්ෂය සඳහන් කරන අතර ඇතමෙක් ක්‍රි.පූ. 3000 ත් 2500 ත් අතර කාලයක මෙම සංහිතාව ඇතිවූ බව සලකති.[5] ඍග්වේදයේ කාල නිර්ණය පිළිබඳ විවධ මත ඉදිරිපත් වී ඇති ආකාරය පසුකාලීන විචාරකයන්ගේ මතවාදයන් තුළින් දැක ගත හැකි වෙයි. එනමුත් පිළිගත හැකියැයි සිතෙන සාධාරණ හේතුන් මුල් කොටගත් මධ්‍යස්ථ මත තුළින් යම් යම් සාධාරණ අනුමානවලට එළඹිය හැකිය. මේ අනුව වේදයන්ගේ කාල පරිච්ඡේදය ලෙස වින්ටර්නිට්ස් ප්‍රමුඛ පඬිවරුන් ඉදිරිපත් කර ඇති ක්‍රි. පූ. 1200-1500 යන්න අවසාන කාලය වශයෙනුත් ක්‍රි.පූ. 2500-2000 යන්න ආරම්භක කාලය වශයෙනුත් ගැනීම මැදහත් පිළිගැනීමක් යැයි සිතිය හැකිය.[6]

## ඍග් වෛදික ජනයාගේ භූගෝලීය ව්‍යාප්තිය

ඍග් වේද ආර්යයන් ජනවාසකරණය කර තිබූ භූගෝලීය පරිස්ථිතිය නිශ්චය කර ගැනීමට ප්‍රාථමික වශයෙන් ඍග් වේදයේ නදිස්තුති කාණ්ඩය ඇතුලු මණ්ඩල 10යේ ඇතුළත් ස්ථාන නාම ඇතුළත් සටහන්වලිනුත් ද්විතික වශයෙන් අනාවරණය කර තිබෙන විත්‍රිත ආගුත්ල



ශිෂ්ටාචාරයට අයත් උදයිපුර් බ්‍රහ්ම ගිරි, ජබල් පුර් වැනි ස්ථානවලින් සොයාගෙන තිබෙන පුරාවස්තු ද ඉවහල් වෙයි.[7]

ඍග්වේදයේ සඳහන් වන ගංගාවන්ගේ නම් හඳුනාගත හැකිවේ. ඒවායේ ඓතිහාසික අගය ද අනල්පය. කුභා (කාවුල්), සුවාස්තු(ස්වාම්), ක්‍රැම(කුර්රම්), ගෝමතී(ගුමල්) යන ගංගා නාමවලින් පැහැදිලි වන්නේ ආර්යයන් ඇෆ්ගනිස්ථානයටද පිවිසි සිටි බවයි. සින්ධු හෙවත් ඉන්ඩස් ගං නිම්නය ආර්යවරුන්ගේ ස්ථිර වාසස්ථානය විය. මේ ගංගාව ඔස්සේ සයුරට යන මාර්ගය පිහිටා තිබුණි. සින්ධු ගඟට එක්වූ නදීන් පසෙහි නම් ඍග්වේදයෙහි සඳහන් කෙරේ. විතස්තා (ජේලම්), අසික්නී (චේනාවේ), පරුශ්නී (රාවී), විපාට් (බෙආස්) සහ ශුතුද්‍රී (සුත්ලේජ්) යන මේ පසයි.[8]

'උදාඃ දේවී (උෂස්)' හෙවත් අරුණෝදය දේවතාවා සඳහා ගොතා තිබෙන ගයත්‍රිවලින් ඔවුන් වර්තමාන පංජාබ්වල විසූ බවට තවත් අනියම් සාක්ෂියක් මතුකර ගත හැකිය. ලෝකයේ නෙත් වශීකෘත කරවන සූර්යෝදයක් දැකිය හැකි ප්‍රදේශය පංජාබය ලෙස සැලකේ. ඍග්වේදයේ ඇතැම් ස්ථානයක පංජාබයේ සොබා දහමේ අනිවාර්යය ලක්ෂණ ලෙස දැකිය හැකි මේඝ ගර්ජනා විදුලි කෙටීම ධාරානිපාත වර්ෂා ආදිය පිළිබඳ විස්තර වන ගයත්‍රී දැකිය හැකිය.

අනු, පුරු, යදු, තුර්වශ, ඍචි වැනි ගෝත්‍රිකයන් පරුශ්නි හා ශුතුද්‍රි යන ගංගා අතර ප්‍රදේශය වාස භවනය

කරගෙන සිටි බව පෙනීයයි. සරස්වතී, දෘශ්වතී අන්තර් ගංගා පෙදෙසේ අන්තර් භාගයේ භාරත ගෝත්‍රයත්, දක්ෂිණ භාගායේ පුරු ගෝත්‍රයත් ලැඟුම් ගෙන සිටි අතර සියලුම ගෝත්‍ර අතරින් භාරත ගෝත්‍රය කැපී පෙනෙන බව පෙනෙයි. භරත ගෝත්‍රයේ සුදාස් නැමති රජු පරුශ්නී, ශුතුද්‍රි යන ගංගා අතර ජීවත් වූ ගෝත්‍ර 10 කින් යුත් පෙරමුණක් සමඟ කළ 'දසරාඥ' නැමති යුද්ධයක් ගැන ද සඳහන් වී තිබේ.

හිමවත ගැන ද ඍග්වේදයේ සඳහන් වෙයි. හිමාලයේ මුජාවත් නැමති ශිඛරය සෝම පැළෑටියේ උපත සිදු වූ දේශය යැයි ඍග්වේදයේ දැක්වෙයි. ඍග්වේද ආර්යයන් යමුනා නදිය ගැන දැන සිටි අතර එයට දකුණින් හා නැගෙනහිරින් තිබුණු ප්‍රදේශ ගැන ඔවුනට අවබෝධයක් තිබී නැත. ආර්යයෝ සිය දෙවියන් නොඇදහූ යාග හෝම නොකළ වර්ණයෙන් දුඹුරු නොහොත් කාල වූ 'දස්‍යු' නාමයෙන් හඳුන්වන ලද අනාර්යයන් සමඟ සටන් කරමින් ක්‍රමයෙන් ගංගා නදිය ආශ්‍රිත ප්‍රදේශයට ගමන් කළහ. පසුකාලයේදී පුණ්‍ය ක්ෂේත්‍රයන්ට නිවාස භූමිය වූ ගංගා නදිය ඍග්වේදයෙහි සඳහන් වී නොමැති තරම්ය.[9] ඍග්වේදය වින්ධ්‍යා කඳු ගැන ද සඳහන් කොට නැත. ගංගා නදිය ගැන සඳහන් වන එකම ස්ථානයක් ඍග්වේදයට පසුකාලීනව එකතු කළා යැයි සලකන තන්ත්‍රයක පමණක් සඳහන්ව තිබේ.[10] මේ අනුව ඍග්වේදයේ අන්තර්ගත භූගෝලීය කරුණු අනුව භාරතීය කඳුකර ප්‍රදේශ හා පංජාබය මෙන්ම අවට තැනිතලා ප්‍රදේශ යන නියම හින්දුස්ථානය ගැන ඍග්වේදයේ සඳහන් වේයැයි



පිළිගැනේ. එසේම එම භූගෝලීය ප්‍රදේශ සඳහන් සූක්ත ඒ ඒ ප්‍රදේශවල රචිත යැයි උගතුන්ගේ මතය වී තිබේ.[11]

## ඍග් වෛදික විවාහය හා පවුල් සංස්ථාව

ඍග්වේදයේ සූක්තයන්ගෙන් පිළිබිඹු වන සමාජය ප්‍රාණවත් වූ ද ක්‍රියාශූර වූ ද සෞඛ්‍යයෙන් යුක්ත වූ ද ජනකායකින් යුක්ත වූවකි.[12] අරුණෝදයේ අවදි වී සූර්ය දෙවියන්ට ඍග්වේද යුගයේ අඹු සැමියන් ස්තෝත්‍ර ගායනා කළ ආකාරය ඍග්වේදයේ සඳහන් වන බැවින් ඍග්වේද කාලීන සමාජ ක්‍රමයේ මෞලික පදනම යුග බැම්මෙන් බැඳුන පවුල් ඒකකය වූ බව පෙනේ. පවුල් සංස්ථාව තුළින් පුරුෂයා හා භාර්යාවගේ එකතුවීම පාරිශුද්ධ බැඳීමක් හැටියට සලකා ඇත්තේය. මේ කාලයේ පැවති සමාජ සංවිධානය යටතේ සැමියාට පවුලෙහි ප්‍රභුත්වය ලැබී තිබිණි.[13] පොදු නිවසක වෙසෙමින් ඊට අයත් වස්තුව හිමි කරගෙන එකම පොදු අග්නි කුණ්ඩයක වැඳුම් පිදුම් කළ සමාජයේ අංශයක් පවුල විය. ගෘහපතියා සිය බිරිය සිය දූ පුතුන් සහ ඔවුන්ගේ කුලයන් කෙරේ සම්පූර්ණ ඒකාධිපතියා වීය.[14]

ඍග්වේද සමයේදී බොහෝවිට එක් වංශයකට අයත් පවුල් එකට වාසය කළහ. ඔවුන් සංයුක්ත පවුල් වශයෙන් ජීවත් වූ අතර දරු මුණුබුරන් සහිතව ප්‍රීතියෙන් කල් යැවීම ඔවුන්ගේ අරමුණ වී තිබේ.

ඉහෛව ස්තං මාවි යෞෂ්ටං විශ්වමායුර්ව්‍යශ්නුතං

ක්‍රීළන්තෞ පුත්‍රෛනප්තෘභිර් මොදමානෞ ස්වේ ගෘහෙ (ඍග්.x.85.42)[15]

මෙයින් ඥාතිත්වයේ මූලිකාවස්ථාව ද පිළිබිඹු වෙයි. මොවුන් එකම ගෘහයක වසමින් එකට ආහාරපාන ගනිමින් ජීවත් වූ අතර සම්පත් සමසේ භුක්ති විඳ ඇත. ස්වාමියාගේ සහෝදර සහෝදරියන් ද එකම ගෘහයේ විසූ බව ඍග්වේදයේ පෙනේ. එසේ නම් විවාහයෙන් පසු ඔවුන් ස්වාමියාගේ මහගෙදර පදිංචියට ගොස් ඇත.

සම්‍රාඥී ශ්වශුරෙ භව සම්‍රාඥී ශ්වශ්‍රුවාං භව
නානාන්දරී සාම්‍රාඥී භව සම්‍රාඥී අධිදෙවෘෂු (ඍග්. x.85.46)[16]

ගෙදර හාමිනේ බිරිය වීය. යඥයන්හි ද සහභාගී වූ ඕ පවුලේ ස්ත්‍රී වර්ගයා හා දැසි දසුන් පාලනය කරන්නී ද වූවාය. වෛදික විවාහ ගීතයක් විවාහාදර්ශය කෙතරම් උසස් වී ද යන්න පෙන්වයි.

"දුෂ්ට ඇසින් තොරව, ඔබේ හිමියා නොරිදවා අපේ පශු ගණයා කෙරේ කාරුණිකව, යෙහෙළියක් වෙනු. උත්සාහවත් වනු. වීර දරුවන් වදව, දෙවියන් අදහව. සැපෙන් ජීවත්වෙනු. අපගේ ද්විපද චතුස්පදයනට අභිවෘද්ධිය ගෙනෙව."



ඍග්වේද යුගයේ විවාහය දරුවන් ලැබීම උදෙසා හා ජීවිතයේ ආනන්දය හා පරිපූර්ණත්වය ලබා ගැනීම උදෙසා වූ වැදගත් සංස්කාරයක් සේ සලකා තිබේ.

"ගෘභාණාමි තෙ සෞභාගත්වාය හස්තං
මයා පත්‍යා ජරදෂ්ටිර්යථාසඃ" (ඍග්. x.85.36)[17]

"ඔබගේ ස්වාමි පුරුෂයා වන මා හා එකට මහලු වියට පත්විය හැකි සේ සෞභාග්‍ය පිණිස මම ඔබගේ අත ගනිමි."

"ඉමාං ත්වමීන්ද්‍ර මීශ්වඃ සපුත්‍රාං සුභගාං කෘණු
දශාස්‍යාං පුත්‍රාං දෙහි පතිමෙකාදශං කෘධි"

"ත්‍යාගශීලි ඉන්ද්‍ර දෙවියනි, මැය යහපත් පුතුන්ගේ මවක් බවට පත් කරන්න. ඇයට සෞභාග්‍යය පිරිනමන්න. පුතුන් දස දෙනෙකු දෙන්න. සැමියා එකොළොස් වැන්නා කරන්න."

මෙලෙස ඍග් වෛදික සමාජයේ විවාහය, පවුල් ජීවිතය මඟින් බලාපොරොත්තු වූයේ යහපත් දරු පරපුරක් අනාගත සමාජය උදෙසා ඇති කිරීම බව පැහැදිලි වෙයි. විශේෂයෙන් ගැහැණු දරුවෙකුගේ උපතට වඩා පිරිමි දරුවෙකුගේ උපත භාග්‍යයක් ලෙස සලකා ඇත්තේය. ආහාරපාන සැපයීම හා පවුල රැකවරණය කිරීම යන උභය හේතූන් නිසා පවුල් ඒකකයේ පිරිමි පක්ෂයට වැදගත් ස්ථානයක් ලැබිණි. පවුලේ සාමාජිකයන් සම්බන්ධයෙන් පියවරු අත්තනෝමතිකව ක්‍රියා කළ අවස්ථාවක් ලෙස ඍග්වේද සංහිතාවේ දැක්වෙන එක්තරා පියෙකු විසින් පුතෙකුගේ ඇස් අන්ධ කළේ යැයි කරන සඳහන දැක්විය

හැකිය. කාන්තාවකගේ උපත අභාග්‍යයක් ලෙස සලකන ලද මුත් ඍග් වෛදික සමාජයේ පවුල තුළ ගැහැණු දරුවන් ඉපදුණු පසු ආදරයෙන් රැක බලාගත් අතර ඇතැම් ගැහැණු දරුවන් උසස් ඉගෙනීමක් ලද ආකාරය 'විශ්වරා', 'ඝෝෂා', 'අපාලා' යන ඍග්වේදයේ සඳහන් කාන්තාවන්ගෙන් ප්‍රකට වෙයි.[18]

ඍග් වෛදික යුගයේ දක්නට ලැබුණු ගෘහය ලීයෙන් තැනූ මැටි බිත්ති සහිත කොළ අතු සෙවිලි කළ එකක් විය. මැටි බිම තණකොළ පිදුරු අතුරන ලද්දේය. වස්ත්‍රය සාමාන්‍යයෙන් ලෝමවලින් හා සමින් තනා ගන්නා ලදි. ඉඟටිය වටා පටියක් බඳනා ලදි. එසේම සළුවක් හෝ ලෝගුවක් උරහිස්හි දමන ලදි.[19] ඍග්වේද ආර්යයන්ගේ ඇඳුම:- යට ඇඳුම, පිට ඇඳුම, උඩ කය වස්ත්‍රය හා හිස් වැසුම යනුවෙන් කොටස් හතරකින් යුක්ත වී ඇත්තේය.

විවාහ හා නැටුම් අවස්ථාවලදී විසිතුරු ඇඳුම් අඳිනා ලදි. ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම මාල, වළලු, නූපුර ආදි රන් රිදීවලින් තැනූ ආභරණ පැළඳි බව ඍග්වේදයේ iv.37.2, v.35.1, v.58.01 යන ගීතිකාවල සඳහන් වෙයි. සැලකිල්ලෙන් කෙස් පීරා සරසන ලද්දේය. කර්ණාභරණ ද ග්‍රීවාභරණ ද පළඳනා ලදහ.

ඍග්වේදයේ සඳහන් පරිදි ඉන්ද්‍ර ආර්යවරු තදබල අක්ෂ ධූර්තයෝ වූහ. වර්තමානයේ මෙන්ම ඍග් වෛදික යුගයේ ද එය පවුල් ජීවිතයට බරපතල ලෙස හානි පැමිණ වූ



ආකාරය ඍග්වේදයේ (X.34) සූදුකාරයෙකුගේ ඛේදජනක අවස්ථාවක් ප්‍රකට කරන සූක්තයෙන් පැහැදිලි කරයි. එහි සඳහන් පරිදි මෙම සූදුකාරයාගේ බිරිඳ ඔහුව අතහැර ගොස් ඇති අතර පවුලේ අනික් අය ඔහුට ද්වේෂ කරන ආකාරය දක්වයි. එම ගීතිකාව මෙසේය.

"මාගේ බිරිය මා හැර දමයි. ඇගේ මව් මට ද්වේෂ කරයි. සූදුකාරයා සිය ව්‍යසනයන්හිදී අනුකම්පා නොලබයි. අධික මිල ඇති දිරාපත් මහලු අශ්වයෙකුට වඩා උසස් වූ ව්‍යවහාරයක් සූදුකරුවෙකුට ඇතැයි මට නොපෙනෙයි."[20]

මෙම මන්ත්‍රය අවසාන වන්නේ උතුම් අවවාදයකිනි. "දාදු කෙළියේ නොයෙදෙව, තාගේ කුඹුර වගා කරව, ඒවා ගැන සෑහෙන පමණ කල්පනා කරමින් ධනය වින්දනය කරව. සූදුකාරය තාගේ ගවයෝ ඇත. බිරිඳ ඇත. උත්තම සවිතෘ මේ අවවාදය දෙයි."

මෙලෙස ඍග් වෛදික සමාජයේ පවුල් සංස්ථාව ක්‍රියාත්මක වී ඇත. විශේෂයෙන් පිතෘ මූලික සමාජයක් මෙහි දක්නට ලැබේ. දරුවන් ලබා පරම්පරාව පවත්වාගෙන යාම සඳහා විවාහය සිදු වී ඇත. කාන්තාව පහත් කොට සැලකීමක් මෙහි දක්නට නොවේ. එලෙසම දූ කෙළිය නිසා පවුල් සංස්ථාව තුළ යම් යම් ප්‍රශ්න මතු වී ඇති ආකාරය ද උක්ත කරුණු මඟින් පැහැදිලි වෙයි. ඒ අනුව ඍග් වෛදික

යුගයේ පවුල මූලික සමාජ ඒකකය, සමාජ තැනුම් ඒකකය ලෙස ක්‍රියාත්මක වී ඇති බැව් මැනවින් පැහැදිලි වෙයි.

**ඍග් වෛදිකාගම**

භාරත ජනතාවගේ මතු නොව පොදුවේ ගත් කල මුළු මහත් මානව වර්ගයාගේ ම ආගම පිළිබඳ සංකල්පය විමසා බලන්නෙකුට ඍග්වේදය වූ කලී මඟහැර නොයා හැකි මූලාශ්‍රයකි. ඒ එය පශ්චාත්කාලීන ජනතාවක විසින් තමන්ගේ ආදිතම ආගමික ග්‍රන්ථය ලෙස සලකනු ලබන නිසා නොවේ. ආගමික අර්ථයකින්ම පබඳින ලදැයි කිව නොහැකි අවස්ථා රාශියක් ඍග්වේදය තුළින්ම හමුවේ. එහි ඇතැම් තැනක දිවා කාලයෙහි දීප්තිමත්ව බබළන රාත්‍රි කාලයෙහි තරු රැසින් විසිතුරු ආකාශය වර්ණිතය. විදුලිය ගින්න, උදෑසන, මහපොළව ආදී වශයෙන් ඍග්වේදයෙහි වර්ණිත ස්වාභාවික ප්‍රපඤ්චයෝ හැම විටකම දේවත්වයෙන් සලකා වර්ණනා කරනු ලැබුවාහු වෙති. එසේ වුවත් ඍග්වේදය පුරාම හුයක් මෙන් දිවෙන ආගමික චින්තනය වසර දහස් ගණනක් පැරණිය.[21]

ඍච් (ස්තුති ) කිරීමෙහි ධාතුවෙන් නිපන් ඍච් (ස්තුති ගීතිකාව) යන ස්ත්‍රී ලිංගික ශබ්දය විද් (දැනීමේ) ධාතුවෙන් නිපන් වේද ශබ්දය සමඟ එක් වීමේදි "ච" "ග්" බවට පැමිණීමෙන් ඍග්වේද යන්න සෑදී ඇත.[22] ඍග්වේදාගත



ආගමික චින්තනයේ අවස්ථා ත්‍රයක් ගැන රාධා ක්‍රිෂ්ණන් පඬිවරයා සඳහන් කරයි.[23]

01. ස්වභාවවාදී බහුදේවවාදය
02. ඒක දේවවාදය
03. අද්වෛතවාදය

යනුවෙනි. මෙම වර්ග කිරීම තවදුරටත් ඉදිරියට ගෙන යමින් නැවත ඒ ඒ අවස්ථාවලට අයත් දෙවියන් ද නම් කරමින් ඔහු විසින්ම අවස්ථා පහකට බෙදා දක්වනු ලැබ ඇත.

01. ස්වභාව ධර්මය පිදීම පිළිබඳ මූලික අවස්ථාව - දෞස්
02. අතිශයින් සදාචාරශීලි දෙවියා - වරුණ
03. පැරදවීමේ හා යටත් කරගැනීමේ යුගය - ඉන්ද්‍ර
04. ඒකදේවවාදීන්ගේ දෙවියා - ප්‍රජාපති
05. මේ අවස්ථා හතරේම පූර්ණත්වය හෙවත් ඒකත්වය- බ්‍රහ්මන් [24]

ඍග්වේදයේ සඳහන් වන පරිදි සූර්ය, පෘථිවි, අග්නි, වායු, මරුත්, පර්ජන්‍ය, උෂස්, රාත්‍රි වැනි දේව නම්වලින් පෙනෙන්නේ ස්වාභාවික වස්තූන්ට පමණක් නොව සිදුවීම්වලට ද හැඟීම්වලට ද දේවත්වය ආරෝපණය කිරීමෙන් දේව පරපුර ඇති වුණු බවයි. වෛදික දෙවිවරු මිනිස් රුව ආරෝපණය කරන ලද ස්වාභාවික වස්තූන් බව ඍග් වේදයෙහි එන දේව වර්ණනාවන්ගේ විශේෂ ලක්ෂණ පරීක්ෂා කරන්නකුට පැහැදිලිවම පෙනේ.[25] ඍග්වේදයේ දක්නට

ලැබෙන බහුදේවාදි ආගමික චින්තනය යටතේ දේව ගණය ප්‍රධාන කොටස් තුනකට බෙදා දක්වා ඇත.

01. ස්වර්ගයෙහි වාසය කරන්නෝ (ස්වඃ ද්‍යුස්ථානඃ) මේ ගණයට අයත් දෙවිවරු ද්‍යෞස්, වරුණ, මිත්‍ර, සවිතෘ, සූර්ය, උෂස්, පූෂන්, අශ්විනෞ, රාත්‍රි ආදී දෙවිවරු

02. පෘථිවියෙහි වාසය කරන්නෝ (භූ පෘථිවීස්ථානාඃ) අග්නි, පෘථිවී, සෝම ආදි දෙවිවරු මේ ගණයට අයත් වෙති.

03. අහසෙහි වාසය කරන්නෝ (භුවඃ අන්තරීක්ෂස්ථානාඃ) පර්ජන්‍ය, ඉන්ද්‍ර, අපාංනපාත්, මරුත්, වායු, අප්සරස්, රුද්‍ර ආදි දෙවිවරු මෙම ගණයට අයත් වෙති.[26]

"යෙදෙවාසො දිවේ‍යකාදශ ස්ථ
පෘථිව්‍යාමධේ‍යකාදශ ස්ථ
අප්සුක්ෂිතො මහිනෛකාදශ ස්ථ
තෙ දෙවාසො යඥමිමං ජුෂධ්වම්" (ඍග්. 1.139.11) [27]

ඍග්වේදයේ බෙහෙවින්ම සොබාදහමේ ශක්තීනට ජීවත්භාවරෝපණය කිරීමෙන් මවාගත් දේව වන්දනාව සමඟ අදාළය. වේද සූක්ත මූලික වශයෙන් මෙකී දෙවියන් යදින යාතිකා වෙයි.[28] මෙය තවදුරටත් පැහැදිලි කිරීමේ දී ජයදේව තිලකසිරි මහතාගේ පහත ප්‍රකාශය ඉතා වැදගත් වේ.

"වෛදික සූක්තයන්හි සිය හැඟීම පවසන ඍෂිවරුන් පළමුව යැද්දේ ඉරු දෙවියන්ටවත් සඳු දෙවියන්ටවත් ගිනි දෙවියන්ටවත් වෙන දෙවිවරුන්ටවත් නොවේ. ස්වභාව



ධර්මයේ විවිධ අංග වන අහසේ දිනපතාම නැඟ එන සූර්යයාට ද රාත්‍රියෙහි සිය රැස්වලින් ලොව නහවන චන්ද්‍රයාට ද අහසෙහි සමහර විට බැබැළෙන විදුලි එළියට ද මිහිපිට නිතරම දැල්වෙන ගිනි දැල්වලට ද එසේම ඇසට පෙනෙන වෙනත් නොයෙක් ස්වාභාවික වස්තූන්ට ද වෙයි."[29]

අග්නි එනම් ගින්දර වෛදික ජනතාවගේ ප්‍රධාන දෙවියෙක් විය. එයට බලපෑ සාධාරණ හේතු ද විය. ගින්දර ශිෂ්ටාචාරාගත වූ මිනිසාට අතිශයින් ප්‍රයෝජනවත් බල ශක්තියක් වූවා සේම ගින්දර සොයාගැනීම මිනිසාගේ යෝධ පිම්මක් ලෙස සලකනු ලබන නිසාය. ආහාර පිසීමට, රාත්‍රියේ ආලෝකය ලබා ගැනීමට, සතුන් පලවා හැරීමට, සීතල දුරුකර ගැනීමට ආදී විවිධ කාර්යයන්ට ගින්න මහත් සේ උපකාරී විය. තව ද අග්නිය දෙවියනට පුද පූජා රැගෙන යන අතරමැදියා ද විය. එනම් යාග ගින්න වූයේ අග්නියයි. මෙසේ ප්‍රයෝජනවත් වන අග්නිය කෝප වුවහොත් සියල්ල දවා හළු කිරීමට තරම් වූ ශක්තියකින් ද යුක්තය. එබැවින් ගින්දරින් ලැබෙන ඉමහත් වූ ප්‍රයෝජන නිසා අග්නි දෙවියාට ගෞරවයකින් ද, කළ හැකි විනාශය දත් නිසා එය වළක්වා ගැනීමට ආයාචනය කළ යුතු වූ හෙයින් එයට ඉමහත් බියකින් ද වෛදික ජනතාව පසු වූ බව පෙනේ.

"අග්නිමීළේ පුරෝහිතං යඥස්‍ය දේවමෘත්විජම්
හෝතාරං රත්නධාතමම්"[30]

අග්නි දෙවියන් අමතන්නේ යාගයේ දිව්‍ය සංවිධායකතුමා ලෙසටය. ගෘහ පූජක ලෙසය. එනිසයි යදින්නා අග්නි දෙවියා වර්ණනා කිරීමට යොමු වන්නේ.

''උප ත්වාග්නේ දිවේ දිවේ - දෝෂාවස්තර්ධියා වයම් නමෝ භරන්ත ඒමසි.''[31]

අඳුර දුරු කරන අග්නියට ආමන්ත්‍රණය කරන යදින්නා ''අපි දිනපතාම ඔබට ප්‍රණාම සිතිවිලි දරාගෙන පැමිණියෙමු'' යැයි ප්‍රකාශ කර සිටියි. මේ ගීතිකාවෙන් පැහැදිලි වන්නේ අග්නිය කෙරෙහි වූ ගෞරවයයි.

ඍග්වේදයේ සඳහන් දෙවිවරුන් අතර ඉන්ද්‍ර දෙවියා වෛදික ඉන්දියානුවන්ගේ සැබෑ ජාතික දෙවියා ලෙස නම් කළ හැකිය. කෙසේ වුව ද ඍග්වේද සමයෙහි ඉන්දියානුවන් විසූයේ සටනෙහි නිරත වූ කලහකාරී ජාතියක් ලෙසිනි. එබැවින් ඉන්ද්‍ර වූ කලී බෙහෙවින්ම රණකාමි දෙවියෙකි. ඔහුගේ සුවිශේෂි ශක්තියත් කලහකාරීත්වයත් පුන පුනා විස්තර කරනු ලැබේ. සිය අකුණු පහරින් රකුසන් වනසා දමමින් ඔවුන් හා ඉන්ද්‍ර දෙවියා කරන සටන් ගැන ඍග්වේදයේ විස්තර කරයි.[32]

''යෝ ජාත ඒව ප්‍රථමො මනස්වාන්
දෙවො දෙවාන් ක්‍රතුනා පර්යභූෂත්
යස්‍ය ශුෂ්මාද් රොදසී අභ්‍යසෙතම්
නෘම්ණස්‍ය මහ්නා ස ජනාස ඉන්ද්‍ර'' (ඍග්.II-12-1)[33]



''යම් නුවණැති පළමු දෙවියෙක් උපන් කෙණෙහිම අවශේෂ අනෙක් දෙවියන් රැක්කේ ද සිය සවියෙන් යමෙකුගේ මහත් වූ විකුමේ තෙදග හමුවේ දෙලොවමැ තදින් සැලිනි ද ජනයිනි, ඒ ඉන්ද්‍ර නම්.''

විශේෂයෙන් ඉන්ද්‍ර දෙවියා ඍග් වෛදික ජනයාගේ රණකාමී දෙවියා නිසා ඔහු විසින් සතුරන් පරදවන ලදි. ඔහු පරදවන සතුරන් අතර 'වෘත්‍ර', 'වල' හෙවත් 'පණි' නම් අසුරයා වෙයි. මෙයින් එකල ජනයා යුද මානසිකත්වයෙන් යුතුව කටයුතු කළ නිසා ඉන්ද්‍ර දෙවියන් යුද්ධය සඳහා වූ දෙවියා ලෙස සලකන ලදි. ඒ පිළිබඳව සඳහන් කරන ඍග්වේද ගීතිකාව මෙසේය.

''යො හත්වාහිමරිණාත් සප්ත සින්ධූන්
යො ගා උදාජදපධා වලස්‍ය
යෝ අශ්මනෝරන්තරග්නිං ජජාන
සංවෘක්සමත්සු ස ජනාස ඉන්ද්‍රඃ'' (ඍග්. II-12-iii)[34]

''යමෙක් වෘත්‍ර නම් සර්ප අසුරයා මරා සප්ත ගංගා මුදා හැරියේ ද යමෙක් වල අසුරයා විසින් හිර කොට සිටි දෙනුන් මුදා විසුරුවා හැරියේ ද යමෙක් පර්වත අතර ගිනි සොයා ගත්තේ ද ජනයිනි, සටනෙහිදී ජයග්‍රාහි ඔහු ඉන්ද්‍ර වෙයි.''

මෙසේ ඉන්ද්‍ර දෙවියා ඍග් වෛදික ජනයාගේ යුධ ජයග්‍රහණයන් සඳහා පිහිට වූ ආකාරය ඔහු රණකාමී දෙවියා වූ ආකාරය පැහැදිලි වෙයි. ඉතාම උසස් වූත් මහත්ම උද්වේග

පූර්ණවූත් පද්‍යයන් අතරට අවිවාදයෙන්ම ගැනෙන්නේ වරුණ දෙවියා සඳහා කියැවුණු ගීතයෝය. ඒවායේ ගණන ද එතරම් නොවේ. කෙසේ වුව ද වෛදික දෙවිවරුන් අතරින් මිනිසුන්ට වඩා උතුම් ලෙසින් ඉහළට නන්වන ලද එකම දෙවියා වරුණය. ඔහු වෙතට සමීපවීමට කවියා තැත් කරනුයේ හරසරිණි. බියෙන් වෙවුලමිනි. වරුණ වූ කලී මිනිසුන්ගේ සදාචාර පැවතුම් පිළිබඳ තකන්නාවූත් පාපීනට දඬුවම් කරන්නාවූත් දෙවියාය.[35]

"අව ද්‍රැග්ධානි පිත්‍ර්‍යා සෘජානො
වයා වයං චකෘමා තනූභිඃ
අව රාජන්පශුතෘපං න තායුං
සෘජා වත්සං න දාම්නො වශිෂ්ඨම්"[36]

"අපගේ පියවරුන්ගේත් අපි තමන්ම යම් වැරදි ක්‍රියා කළෙමු ද (ඒවාත්) ඉවත් කරනු මැනවි. (වරුණ) දේව රාජයාණෙනි, රැහැනින් ගව සොරෙකු මෙන් (රැහැනින්) වස්සකු මෙන් වශිෂ්ඨ ඉසිවරයා මුදාහළ මැනවි."

"න ස ස්වෝ දක්ෂෝ වරුණ ධ්‍රැතිඃ සා
සුරා මන්‍යුර්විභිදකෝ අචිත්තිඃ
අස්ති ජ්‍යායාන්කනීයස උපාරේ
ස්වප්නශ්චනේදනෘතස්‍ය ප්‍රයෝතා"

"වරුණ දෙවියනි, එය මගේ පැතුම නොවේ. එය නොමග යෑමයි. (එනම්) සුරාව, කෝපය, දාදු කෙළිය, නොදැන කළ වැරදියි. කනිෂ්ඨයාගේ වරදෙහි ජ්‍යෙෂ්ඨයා සිටී. නින්ද පවා වරද වළක්වන්නේ ද නැත."[37]



මෙසේ වරුණ දෙවියා ඍග් වෛදික සමාජයේ සදාචාරය ආරක්ෂා කරන්නා ලෙස ක්‍රියාත්මක විය. එමඟින් වෛදික ජනයා තම ජීවිතය යහපත් ලෙස පවත්වාගෙන යාම සඳහා උත්සාහ කළාට සැක නැත. එයට හේතු වන්නේ එසේ නො කළහොත් වරුණ දෙවියාගේ උදහසට ලක්ව තම දරුවන්, පරම්පරාව, ධන සම්පත් විනාශයට පත්වේ යයි කල්පනා කළ නිසාය. විශේෂයෙන් මුහුදටත් ජලයටත් අරක්ගත් දෙවියා ලෙස ඍග්වේදයෙහිම වරුණ පෙනී සිටී. එබැවින් ඔහු අපරාධ කළවුන්ට දඬුවම් කරන්නේ විශේෂයෙන්ම දිය උදර රෝගය වැළඳවීමෙනි. දිය උදර රෝගයෙන් පෙළෙන්නෙකු කරන සරල යාතිකාවක් ඍග්වේදයේ vii වන මණ්ඩලයේ 89 වන සූක්තයෙන් දක්නට ලැබේ. එමඟින් වරුණ දෙවියාගේ ස්වභාවය දැනගත හැකිය.

ඍග්වේදයේ ඉන්ද්‍ර, මරුත්, අග්නි, ආදී දෙවිවරු කාලයෙන් කාලයට ඉතා උසස් කොට සලකමින් වර්ණනා කර තිබේ. මීට අමතරව පෘථිවි හෙවත් මූර්තිමත් මහපොළව පෘථිවිගේත් දෙවියන්ගේත් මව අරුණෝදය හෙවත් උෂස්, රාත්‍රි වන දෙව්ලිය හෙවත් අරණ්‍යානි, ආදීහු ඍග්වේදයේ එන දේවතාවියෝ වෙති. තව ද ශ්‍රද්ධාව, කෝපය, හෙවත් මන්‍යු ආදී හැඟීම් ද විරල වශයෙන් දේවත්වයෙන් සලකනු ලැබ

ඇත. මාතලි, ත්වෂ්ටෘ, විශ්වකර්මන් බෘහස්පති ආදී අප්‍රධාන දෙවිවරුන් රාශියක් ගැන ද ඍග්වේදයේ සඳහන්ව ඇත.

විශ්වේදේවාඃ (ඍග් ii. 13, iii.2.09, v.3.1) හෙවත් සියලු දෙවිවරුන් නමින් වූ සංකල්පය ද ඍග්වේදාගමේ වැදගත් අවස්ථාවකි. මෙම සංකල්පය සඳහා ඍග්වේදයේ සූක්ත හතළිහක් පමණ වන ඉඩකඩක් වෙන් කොට තිබීම ද මෙහි වැදගත්කම අවධාරණය කරයි. පසුකාලය වන විට ඍග්වේදය තුළ දෙවියන් අභියෝගයට ලක් කළ ආකාරය ද දක්නට ලැබේ. මෙහිලා ඉන්ද්‍රගේ අසත්‍යය හා ප්‍රධානත්‍වය ප්‍රශ්න කර ඇති සූක්ත වැදගත් වෙයි. (x.86.1, ii.12.5) එලෙසම x.117.1 සූක්තයෙන් ද දෙවියන් අභියෝගයට ලක්කර ඇත. විශේෂයෙන් එතෙක් පැවති පුද්ගල දේවත්‍වයෙන් නිෂ්පුද්ගල දේවත්‍වයක් වෙත යොමු වූ බවට සලකුණු හමුවේ. ඍග්වේදයේ අන්තර්ගත ප්‍රසිද්ධ ප්‍රකාශයක් වන "එකං සද් විප්‍රා බහුධා වදන්ති" "එකම සත් වූ දෙය බමුණෝ...බොහෝ අයුරින් කියති යි" කියවෙන ඍග්වේද පාඨය[38] සත්වූ එකම තත්ත්වයක් පිළිබඳ තත්කාලීන චින්තනය හෙළිදරව් කරයි. එක් කලෙක වරුණ, ඉන්ද්‍ර, අග්නි ආදී විවිධ දෙවිවරු විශ්වයේ කර්තෘන් ලෙස සැලකූ අතර පසුකාලීනව ප්‍රජාපති පිළිබඳ සංකල්පය නැතහොත් හිරණ්‍යගර්භ වඩාත් නිශ්චිත සංකල්පය බවට පත්වෙයි. ආත්මන් සංකල්පයේ වර්ධනය ද මේ ඔස්සේ සිදු වූ බව පෙනේ. ඒ අනුව ඍග් වෛදික සමාජයේ බහු දේවවාදයෙන් ඒකදේවවාදයටත් ඒ ඔස්සේ ඒකවාදය වෙතත් පැමිණි ඍග්වේදාගමේ දේව සංකල්පය පිළිබඳ සලකුණු මෙලෙස හඳුනාගත හැකිය.[39]



## ඍග් වෛදික සමාජයේ ආර්ථිකය හා රැකීරක්ෂා

ලෝකයේ ඕනෑම සමාජයක එම සමාජ ප්‍රවාහකයා වන්නේ එකී ජන සමාජය තුළ ජීවත් වන පුද්ගලයන්ගේ ආර්ථික තත්ත්වයයි. ඍග් වෛදික සමාජයේ ද සමාජ පැවැත්ම උදෙසා ආර්ථික තත්ත්වය හේතු විය. විශේෂයෙන් ආර්යයන් එතෙක් ඉන්දියාවේ සිටි අනාර්ය ජනයා ආක්‍රමණය කරන ලද්දේ තමන්ට ජීවත් වීම සඳහා ඇවසි භූමියක් තහවුරු කරගැනීම සඳහායි. එම භූමිය ඔවුන්ගේ ආර්ථිකයේ ප්‍රධානතම ස්ථානය විය. එයට හේතු වන්නේ කෘෂිකර්මය ඔවුන්ගේ ප්‍රධානතම ජීවනෝපාය බවට පත්ව තිබීමයි. විශේෂයෙන් සින්ධු ප්‍රදේශයට පැමිණ ලැගුම් ගත් ආර්යයන් කෘෂිකර්මය හා සත්ත්ව පාලනය කේන්ද්‍ර කොටගත් අසංකීර්ණ (සරල) ආර්ථික සංවිධානයක උරුමකරුවන් වූ ආකාරය දක්නට ලැබෙයි. සප්ත සින්ධු ප්‍රදේශය වාස භවනය කරගත් ඍග්වේද ආර්යයන් ගෝත්‍ර වශයෙන් ගම්වල උපනිවේශ පිහිටුවාගෙන සරල කෘෂිකාර්මික ජීවනෝපායක නිරත වෙමින් කටු මැටි ගැසූ ගෙවල ලැගුම් ගෙන සිටි බව පෙනේ.[40]

වෛදික ජනතාව හැඳින්වූ 'කෘෂ්ටි' හෙවත් 'වාර්ෂණී' යන නාමයෙන් ගොවි කර්මාන්තයේ අගය පැහැදිලි වෙයි. අස්වද්දන ලද කුඹුර 'උර්වරා' හෙවත් 'ක්ෂේත්‍ර' නාමයෙන් හඳුන්වන ලදි. හිමාලය හා නිම්න ප්‍රදේශයන්හි ප්‍රධාන ශස්‍ය වන 'යව' වැවීම ජනප්‍රිය විය. ඍග්වේදයේ ගීත කිහිපයක් ම

(vii.67.10, x.134.2) 'යව' ගැන සඳහන් වෙයි. නඟුලින් සීසෑම, බීජ වැපිරීම, පොතු හැරීම, පෙළීම ආදිය ගැන ඔවුහු දැන සිටියහ. වාරිමාර්ග ආධාරයෙන් ක්ෂේත්‍රයට ජලය ලබාදුන් අතර වගා බිම පෝර යොදා සාරවත් කළහ.[41]

කෘෂිකර්මය හා සත්ත්ව පාලනය හැරුණු විට කපු හා ලෝම රෙදි වියීම ද රෙදි සායම් කිරීම ද විය. ගැහැණු පිරිමි භේදයකින් තොරව රෙදි වියීමේ යෙදුණු අතර ඍග්වේද යුගයේ ගන්ධාර දේශය ලෝම රෙදි වියීම ගැන වැඩි ප්‍රසිද්ධියක් ලබා තිබුණේය. ගෘහ උපකරණ හා යුද බිමේ ආම්පන්න සඳහා ලෝහ භාවිත කළ බව ද පෙනේ. මේ නිසා ලෝහ කර්මාන්තය ද තවත් ජීවන උපායක් වූ බව පෙනීයයි. ඍග්වේදයේ 'අයශ්' යනුවෙන් හඳුන්වා තිබෙන්නේ 'යකඩ' විය හැකි බව ඉතිහාසඥයන්ගේ පිළිගැනීමයි.

ඍග් වෛදික සමාජයේ ගවයෝ ප්‍රධාන තැනක් ගත්හ. ගොවියා ගවයන් වැඩි කර ගැනීමට යදී. යුද්ධයෙහි යෙදෙන්නෝ වන්දියට ගවයන් පතති. යාග හෝතෘවරයාට ඔහුගේ සේවය වෙනුවෙන් ගවයෝ පිදෙති. සැබැවින්ම කියන්නේ නම් ඍග්වේද සමාජයේ ගවයන් එක්තරා විධියක මූල්‍යමය වස්තුවක් වීය. එහි වටිනාකම තිබුණේ ගවයන් ගණිනි. මේ කාලයේ ගවයන් පූජාර්හ ලෙස සැලකූ බවට සාක්ෂ්‍ය නොලැබේ. නමුත් එක් ස්ථානයක එළදෙන 'නොමැරිය යුතු (අඝ්න්‍ය)' යනුවෙන් යෙදෙයි. කෙසේ වුවත් ගොනුන් හා එළදෙනුන් දෙවර්ගයම ආහාරය සඳහා මරණයට පත්කරන ලද බව ඉතා පැහැදිලි වෙයි.[42]



සී සෑමට සහ ගැල් ඇදීමට ගවයෝ යොදවන ලදහ. මිනිසාගේ පොහොසත්කම ඔහු සතු ගව පට්ටියෙන් ගණන් ගැණිත. ඔවුහු එළු, බැටලු, ගවයන් හා සුනඛ යන සතුන් ඇති කළහ. පිට නැඟියාමට වඩා රිය ඇදීමට පොහොසතුන් විසින් බෙහෙවින්ම අශ්වයෝ යොදවනු ලැබූහ. යව, නොයෙක් වර්ගයේ මෙනේරි, තිරිඟු, කොල්ලු, තල ද වගා කළහ. මෙසේ ශීතෝෂ්ණ කාලීන අස්වැන්න සපයා ගත්හ. සී සෑම, වී වැපිරීම, නෙළීම, පස්ගෝරස කර්මාන්තය, සම් පදම් කිරීම, ලොම් කැපීම, රෙදි වියීම, හා සායම් කිරීම, දැවකම්, තඹ රන් වැඩ, උදලු තැනීම, හී වැල් තැනීම හා තවත් කෘෂි භාණ්ඩ නිර්මාණය ද අද මෙන් එදා ග්‍රාමීය කර්මාන්ත විය.[43] ඒ ඒ විශේෂ කර්මාන්ත වෛදික ආර්ථික තත්ත්වයෙහි සැලකිය යුතු තැනක් ගත්තේය. ගව සමින් බෝතල්, දුනුදිය, සම් පටි ආදිය සෑදීම, වඩුවා වඩු වැඩින් බැහැරව පෙට්ටගම් හා රථ සෑදීම කළේය. විශේෂයෙන් දඩයම් කිරීමෙන් ඉතා ප්‍රයෝජනවත් ආර්ථික කාර්යයක් පිරිමැසිණ. සිංහයෝ, වලස්සු, මී වහරක්, නා මුවන් හා කුරුල්ලෝ මේ සඳහා සාමාන්‍යයෙන් ගොදුරු වූහ.[44] මේ ආකාරයෙන් ඍග් වෛදික සමාජයේ ආර්ථික තත්ත්වය හා රැකී රක්ෂා පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට හැකියාව ඇත.

### ඍග් වෛදික යුගයේ දේශපාලනය

ඍග්වේදය මුල් ආර්යයන්ගේ ජීවන තොරතුරු මෙන්ම ඔවුන්ගේ දේශපාලන තොරතුරු ද ලබාදෙන පුරාතන

ඥාන රාශියේ මූලයයි. විශේෂයෙන් ආර්යයන් ඒ ඒ ප්‍රදේශවල ස්ථිර පදිංචිකාරයන් වෙත් ම ඔවුන්ගේ පාලන තන්ත්‍රය ද එක්තරා ස්ථිර පදනමක් මත ගොඩනැඟුණේය. මොහෙන්ජෝදාරෝහි මිනිසුන් මෙන් නොව මොවුහූ පිතෘ ප්‍රභුත්වය දේශපාලන පදනම කොට ගත්හ. පවුල් කිහිපයක් එක්වූ තැන ගමක්ද, ගම් කිහිපයක් 'විෂ්' නමින් හැඳින්වූ ගෝත්‍රයක් ද, ගෝත්‍ර කිහිපයක් 'ජන' නමින් හැඳින්වුන වංශයක් ද විය. මෙයින් ගමක ප්‍රධානියා 'ග්‍රාමිණී' නමින් ද 'විෂ්' නමින් හැඳින්වුන ගෝත්‍රයක ප්‍රධානියා 'විෂ්පති' නමින් ද ගෝත්‍ර කිහිපයක ප්‍රධානියා 'රාජන්' නමින් ද හැඳින්විණි. 'රාජන්' නැමති තැනැත්තා පසුකලෙක ඇති වූ ප්‍රාදේශීය රජකෙනෙකු තරම් වගකීමක් ඇතිව සිටි කෙනෙකු ලෙස සැලකිය හැකිය. බොහෝවිට මේ රාජ තනතුර පරම්පරාවෙන් ආ එකකි. අග්‍ර විනිශ්චයකාරයාත්, යුද්ධ හමුදාවේ ප්‍රධානියාත් පූජා පැවැත්වීමේදි පූජකයින්ගේ අනුශාසකයාත් වූයේ මේ රාජයාමැයි. ඔහුගේ කටයුතුවලදි 'සේනානි' නම් යුද්ධ හමුදාවේ ප්‍රධානියාත් ගම් ප්‍රධානියාත් යන දෙදෙනා ඔහුට සහාය වූහ.[45]

වෛදික යුගයේ ප්‍රජාවගේ ඉතා බලවත් නියෝජන තන්ත්‍රයක් වූයේ සමිතියයි. මේ සමිතියට ප්‍රජාවගෙන් සුදුසු වයෝවෘද්ධ නීතිගරුක හා පාලන ව්‍යවස්ථාව පිළිබඳ දත් අය ජනතාව විසින් තෝරා පත්කර ගන්නා ලදි. මොවුන් නිශ්චිත ස්ථානයකට රැස්ව ඔවුනට ඇති ප්‍රශ්න පිළිබඳ සාකච්ඡා කරන ලදි. වත්මන් ඉන්දියාවේ 'ලෝක්සභාව' මෙයට



සමානය. විශේෂයෙන් සමිතියේදී සෑම දෙනාටම ප්‍රශ්න ඉදිරිපත් කිරීමේ අවස්ථාව සැලසිණි. මෙහිදී ඉතා සාධාරණ ලෙස ප්‍රශ්න විසඳූ අතර මතභේදයක් පැනනැඟි විට බහුතර කැමැත්තට අනුව එය විසදන ලදි. ඍග්වේදයේ එක් මන්ත්‍රයක සමිති ශබ්දය වෛද්‍යවරයෙකු මෙනැයි දක්වා තිබේ. එනම් යම් අරමුණකින් සමිතිවල රාජ සමූහයා එළඹෙත් ද, ඔවුහූ මෙහි වෛද්‍යවරු මෙන් රැස්වෙති.

''යත්‍රෞෂධීඃ සමග්මත රාජානඃ සමිතාවිව''

(ඍග්.x.97.6)[46]

වෛදික යුගයේ පාලන තන්ත්‍රය වූ සමිති ඉතා දීර්ඝ කාලයක් ස්ථිරව පැවතුණි. එයට හේතුව වන්නේ සමාජයේ ඒ සඳහා සුදුසුම පුද්ගලයන් පත්කර තිබීමත් එම පුද්ගලයන් ඉතා ගෞරවයෙන් හා ඉතසිතින් ඒ පිළිබඳ ක්‍රියාත්මක වීමත්ය.

''සමානො මන්ත්‍රඃ සමිතිඃ සමානී සමානං මනඃ සහ චිත්තමෙෂාම්
සමානං මන්ත්‍රමභි මන්ත්‍රයෙ වඃ සමානෙන වො හවිෂා ජුහොමි'' (ඍග්.x.191.03)[47]

''මෙය ප්‍රජාවගේ ස්තෝත්‍රයක් සමාන වේවා. ඔවුහු එකට එත්වා. ඔවුන්ගේ සිත ද සමාන වේවා. එම්බා පුරෝහිතවරුනි, මම ඔබ සියලුදෙනා සමාන මන්ත්‍රණයෙන් ආමන්ත්‍රණය කළෙමි. සමාන ආකාරයෙන් යාග ද්‍රව්‍ය දෙමි''[48]

''සමානී ව ආකූතිඃ සමානා හෘදයානි වඃ

සමානාමස්තු වො මනො යථාවඃ සුසහාසති''
(ඍග්.x.191.04)[49]

මෙමගින් සමිතිවල සංවිධාන කටයුතු කිරීම උදෙසා මනාවූ උපදේශයක් ලබාදෙයි. එනම් ''ඔබගේ කටයුතු සමාන වේවා. ඔබගේ හදවත හා මනස ද සමාන අදහස් ඇතිව සියලු ආකාරයෙන් සංවිධානය වේවා.''[50]

විශේෂයෙන් වෛදික ජනයා කාලය ගත කළේ තම බලය වැඩිකර ගැනීම සඳහා යුද මානසිකත්වයෙනි. එමනිසා කාලයෙන් කාලයට දෙවිවරුන්ගේ ආරක්ෂාව ප්‍රාර්ථනා කර තිබේ. එහිලා විශේෂයෙන් ඉන්ද්‍ර ප්‍රමුඛවෙයි. 'මම සම්‍රාජ් ඉන්ද්‍ර හා වරුණගෙන් ආරක්ෂාව කැමැත්තෙමි.' ''ඉන්ද්‍රවරුණයොරහං සම්‍රාජොරව ආ වෘණෙ'' (ඍග්.i.17.01)[51] එලෙසම සෝම රජු හා රුද්‍රගෙන් ශක්තිය ලැබීම සඳහා මෙබඳු ප්‍රාර්ථනයක් සිදුකරයි. ''එම්බා සෝම රුද්‍ර ඔබේ දිව්‍ය බලය මැනවින් දරා සිටින රුද්‍ර මේ අපේ සියලු යාඥා ඔබ කෙරේ පැමිණේවි. ඔබේ සත්රුවන් ගෙයක් ගෙයක් පාසා විසුරුවා හරිනු මැනවි. අපගේ මිනිසුන් හා සතුන් සුවපත් කරන්න.''

''සොමාරුද්‍ර ධාරයෙථාමසූර්යං ප්‍ර වාමිෂ්ට'යො
රමශ්නුවන්තු දමෙදමෙ සප්ත රත්නා දධානාං ශං
නො භූතං ද්විපදෙ ශං චතුෂ්පදෙ'' (ඍග්.vi.74.01)[52]

විශේෂයෙන් මෙහි රණවිරුවන්ට දෙන උපදෙස් ද දක්නට ලැබේ ''ජීමූතස්‍යෙව භවති ප්‍රතීකං යද්වර්මී යාති සමදාමුපස්ථෙ අනාවිද්ධයා තන්වා ජය ත්‍වං ස ත්‍වා වර්මණො මහිමා පිපර්තු'' (ඍග්.vi.75.01)[53]



''රණවිරුවනි, යම් විටෙක සුදු ඇඳුමින් සැරසී යුද බිමට පිවිසෙයි ද, එවිට අකුණු හෙලන වැහිවලාකුළක් සේ බියකරු පෙනුමෙන් සිටින්න. තුවාල නොලත් සිරුරෙන් යුතුව ජය ගන්න. කවචයේ මහිමය ඔබ රකීවා.''

ඍග්වේදයේ 'තුර්වශ' රජු හා 'සුදාස්' රජුගේ නම් සඳහන් වෙයි. දෙදෙනාගේ යුද්ධයේදී ඉන්ද්‍රගේ උපකාරයෙන් 'සුදාස්' රජු ජයග්‍රහණය ලබයි. ඒ බව ''තුර්වශ නම් යාගකර්තෘ රජෙක් විය. භෘගු හා දෘහ්‍යුන් විසින් මාළුවකු මෙන් දැලේ බඳනා ලදුව සුදාස් හා තුර්වශගෙන් ධනය සඳහා යවන ලදි. මේ දෙදෙනාගෙන් එකෙක් ඉන්ද්‍ර විසින් මරා දමන ලදි. සුදාස් පන්නා දමන ලදි.''[54] රජු සභා හා සමිතිවලට පැමිණියේය. ඍග්වේද මන්ත්‍රයක රජු සමිතියට පැමිණි බවට පැහැදිලි සඳහනක් ඇත. මේ ආකාර වූ උපුටා ගැනීම්වලින් වෛදික රජුගේ වැදගත්කම පෙනේ.

''පරි සද්මෙව පශුමාන්ති හොතා රාජා න සත්‍යඃ සමතීර්යානඃ'' (ඍග්.ix.72.06)[55]

''දෙවියන් කැඳවන සෘත්විජයෝ යාග ගෘහයට එති. ඒ ආකාරයෙන් ම යහපත් කටයුතු ඇති රජු සමිතියට එයි.''

එසේම ඍග්වේදයේ රජුට ජනතාව විසින් කරන ලද ඉල්ලීම් ද සඳහන් වෙයි ''එම්බා රජතුමනි, ඔබ රටේ අධිපතියා කළේය. ඔබ රටේ ස්වාමියා වන්න. ඔබ ස්ථිර නුවණැති, දෘඪ අදහස් හා හොඳ දේ කරන්නෙක් වන්න. ඔබේ ප්‍රජාව ඔබට කැමතියි. ඔබේ රටට අයහපතක් නොවේවා. එම්බා රජතුමනි, ඔබ පර්වතයක් සේ ස්ථිරව

වාසය කරන්න. එසේම නිශ්චල වන්න. සිය රාජ්‍යය දැඩි ලෙස තනන්න.''

''ආ ත්වාහාර්ෂමන්තරෙධි ධ්‍රැවස්තිෂ්ඨවිචාචලිඃ
විශස්ත්වා සර්වා වාඤ්ඡන්තු මා ත්වද්‍රාෂ්ට්‍රමධි භ්‍රශත්
ඉහෛවෛධි මාප ච්‍යොෂ්ඨාඃ පර්වත ඉවාවිචිචලිඃ
ඉන්ද්‍ර ඉවෙහ ධ්‍රැවස්තිෂ්ඨෙහ රාෂ්ට්‍රමු ධාරය ''
(ඍග්.x.173.01-02)[56]

විශේෂයෙන් ආර්යයන් තම තමා අතරත් සමහරවිට මුල් පදිංචිකාරයින් සමඟත් සටන් කළහ. සටන් පිළිබඳව කරුණු බහුල වශයෙන් දැක්වෙන හෙයින් යුද්ධ කලාව එකල බොහෝ දුරට දියුණු වී තිබුණු බව සිතිය හැකිය. සමහරවිට ඔවුන් පයින් ගොස් මුහුණට මුහුණලා සටන් කළහ. vi.47,48, vi.47.26 යන ගීතිකාවල අශ්වයා හා ඇතා යුද්ධවලදී පාවිච්චි කළ බව සඳහන් වෙයි. එලෙසම පිටරටක යුද්ධය සඳහා ගිය නාවික හමුදාවක් ගැන ද අහස් නැව් පාවිච්චි කළ බව ද සඳහන් වෙයි. දුන්න, හෙල්ල, ප්‍රධාන යුද්ධායුධ හැටියට පාවිච්චි කළ බව පෙනේ. යුද්ධ භූමියේදී රණබෙර ගැසීම ආදිය ද සිදු කර ඇත. මේ අනුව ඍග්වේදයෙන් පැහැදිලි වන්නේ ප්‍රජාවගේ යහපත උදෙසා ආදර්ශවත් රාජ්‍යයක් පිහිටුවීම පිළිබඳව විස්තර වන ආකාරයයි. එසේම අයබදු ආදියෙන් ජනයා පීඩාවට පත් නොකර යහපත් පාලනයක් ගෙන යාම අපේක්ෂා කර ඇති අයුරුයි. එසේම ප්‍රජාවගේ දුක දුරු කිරීම උදෙසා රජු දෙවියන්ගේ තත්ත්වයට පත්ව පාලනය ගෙන යාම සඳහා සමත්වූ ආකාරයයි. එසේම රජු අධිපතියා වූ ආකාරයයි.[57]



ඍග් වෛදික සමාජය පිළිබඳ තව දුරටත් තොරතුරු සාකච්ඡා කිරීමේදී එම කාලයේදී ලේඛන කලාවක් නොතිබුණ ද **බ්‍රහ්මචාරී** යන පදය සඳහන් වන බැවින් යම් රටාවක අධ්‍යාපන ක්‍රමයක් පැවති බව පෙනී යයි. ඍග්වේද ගීතිකා ත්‍රිෂ්ටුභ්, ගයත්‍රි, ජගතී වැනි ඡන්දස්වලින් බැඳ තිබීමෙන් ඡන්දස් ශාස්ත්‍රය අරභයා ඍග්වේද ආර්යයන් තුළ පැවති දැනීම සිතා ගත හැකිය. ඍග්වේදයේ 'මාණ්ඩුක්‍ය' (ගෙම්බන්) නමින් දැක්වෙන ගීතිකාවලින් එන විස්තරවලින් පෙනෙන්නේ වාචෝද්ගත මාධ්‍යයෙන් පැවති අධ්‍යාපන ක්‍රමයක් ඍග්වේද කාලීනව ප්‍රචලිතව තිබුණු බවයි. 'මාණ්ඩුක්‍ය' නමින් වෙන් වී තිබෙන ස්තෝත්‍රාවලියේ පහත දැක්වෙන අන්දමේ ගීතිකා දක්නට ලැබේ.

''යදේෂාමන්‍යෝ අන්‍යස්‍ය වාචං
ශාක්තස්‍යෙව වදති ශික්ෂමාණඃ
සර්වං තදේෂා සමෘධේව පර්ව
යත් සුවාචෝ වදථනාධ්‍යප්සු'' (ඍග්.vii.103.05)[58]

මෙයින් අදහස් වන්නේ ගුරුවරුන් කියන දෙය හඬනඟා කියවන ශිෂ්‍යයන් මෙන් එක ගෙම්බෙකු නාද කරන විට සෙසු ගෙම්බන් එය අනුකරණය කරමින් ජලය මතුපිට නාද කරන බවයි. මේ සඳහනෙන් පෙනී යන්නේ ඍග්වේද කාලීනව ස්මරණ මාධ්‍යය මූලික කොටගත් අධ්‍යාපන මාධ්‍යයක් පැවති බවයි. සෞන්දර්ය විෂය කොටගත් උෂස්, සූර්ය, රාත්‍රි, පර්ජන්‍ය යන දෙවිවරුන් සඳහා වෙන්කර තිබෙන ස්තෝත්‍රවලින් ද මේ බව තහවුරු වෙයි.

භාරතීය ජ්‍යෝතිෂ් ශාස්ත්‍රය, යෝගී ක්‍රම, චිත්‍ර ශිල්පය, මූර්ති කලාව, ගෘහ නිර්මාණය, යන සෑම විෂය ධාරාවකම බිළිඳු අවස්ථාව ඍග්වේදයේ දැකිය හැකිය. වෛද්‍ය විද්‍යාවේ ආරම්භය ඍග්වේදය බව වෛද්‍යවරුන්ගේ ප්‍රමුඛයා හැටියට සම්භාවිත ඍග්වේදයේ සඳහන් වන 'රුද්‍ර' දෙවියන්ගෙන් පැහැදිලි වෙයි. ඍග්වේදයේ වෙදවරුන්ගේ වෙදා යන අර්ථය ඇති ''භිසග්තවමං සා තවා භිසගම් ශ්‍රැණෝමි'' (ඍග්.ii.3) යන අභිධානයෙන් 'රුද්‍ර' දෙවියන් වර්ණනා කර තිබේ.

ඍග්වේද යුගයේ පැවති ක්‍රීඩා ගැන සඳහන් කරන විට දාදු ක්‍රීඩාවට මුල්තැනක් ලැබී තිබිණි. ඍග්වේදයේ 10 වන මණ්ඩලයේ සූදුකාරයාගේ අඳෝනාව නැමති කොටසින් ඒ බව පැහැදිලි වෙයි. ඊට අමතරව රථ ධාවන තරඟය උසස් පෙළේ අයගේ සිත් ගත් ක්‍රීඩාවක් විය. තවත් විනෝද ක්‍රීඩා නම් විදීම හා දඩයම විය. නෘත්‍යය ද ජනප්‍රිය වූවකි. බෙර, වීණා හා හුළං නළා ද ව්‍යවහාර කරන ලදහ. සංගීතය වනාහි ඉපැරණි කලාවකි. උත්සවයන්හි ද යඥයන්හි ද වන්දීන්ගේ ස්තෝත්‍ර පාඨ ශ්‍රවණය තවත් සිත්ගත් විනෝද ක්‍රීඩාවකි.[59]

ඍග්වේද සමයේ කුලභේදය එතරම් තදින් බලපැවැත් වූ බව පෙනෙන්නට නැත. එකල ආර්යයන් සහ දාසයින් වශයෙන් සමාජය කොටස් දෙකකට බෙදී තිබුණි. වර්ණවත් මිනිසුන් 'අර්ය' යන නමින් ද ඔවුන්ගේ බලයට යටත් වූ කළු මිනිසුන් 'දාස' යන නමින් ද හැඳින්විනි. එලෙසම ඍග්වේද ආර්යයන් මුල් පදිංචිකරුවන් 'මුද්‍රවාහඃ', 'අදේව', 'අබ්‍රහ්මන්',



'අකර්මන්', 'අයජ්වන්' යන නම්වලින් හඳුන්වා ඇත. නමුත් ඍග්වේද යුගයේ අවසන් කාලය වන විට පසුකාලීන වේද සංහිතාවේ ප්‍රකටව දක්නට ලැබෙන කුල ක්‍රමයේ (චතුර්වර්ණ) ඇතිවීම දක්නට ලැබේ. ඍග්වේදයේ 10 ව මණ්ඩලයේ 90 වන ගීතිකාවලිය වන 'පුරුෂ සූක්තය' එයට දෙස් දෙයි.

මේ අනුව තම ජනාවාස කරණය පිණිස භාරතයට පැමිණි ආර්යයන් ක්‍රමයෙන් ඉන්දියාවේ එවකට ජීවත් වූ අය යටත් කොට තම සභ්‍යත්වය අනුව තමන්ගේ සංස්කෘතික අංගයන් හා එතෙක් භාරතයේ මූල්කාලීන ජනයන් අනුගමනය කරන ලද සංස්කෘතික අංගයන්ගෙන් ද යුක්තව තම සමාජ සංස්ථාව ආගමික, සමාජික, දේශපාලනික හා ආර්ථික යන අංගයන්ගෙන් පෝෂණය කොට රැකගෙන පැමිණි ආකාරය උක්ත කරුණු මගින් මොනවට අපට පැහැදිලි වෙයි. එකී ලක්ෂණයන් පසුකාලීන භාරත දේශවාසීන්ගේ සමාජ සංස්ථාවන් පරිපෝෂණය කරීම සඳහා බලපෑ ආකාරය ද එම ඓතිහාසික තොරතුරු ගවේෂණය කිරීමේදී ස්ඵුට කරගත හැකිය.

## සමාලෝචනය

මෙහිලා උක්ත කරුණු අනුව ඍග් වෛදික ජනයා ගංගා ආශ්‍රිතව තම වාස භූමි තනාගෙන ජීවත් වූ ආකාරය පැහැදිලි වෙයි. එහිදී විශේෂයෙන් භාරතීය කඳුකර ප්‍රදේශ හා පංජාබය මෙන්ම අවට තැනිතලා ප්‍රදේශ යන නියම

හින්දුස්ථානය ගැන ඍග්වේදයේ සඳහන් වේ යැයි පිළිගැනේ. මෙම ප්‍රදේශයේ ජීවත් වූ ඍග් වෛදික ජනයා පිතෘ මූලික වූ පවුල් සංස්ථාව සිය සමාජයේ මූලික ඒකකය වශයෙන් තනාගෙන ජීවත් වූ ආකාරය උක්ත කරුණු මඟින් විශද වෙයි. විශේෂයෙන් එහි සියලුදෙනාට සම තැන ලැබී ඇති ආකාරය ද දක්නට ලැබේ. සොබාදහමේ වස්තූන් මුල් කොට දේවත්වය ආරෝපණය කරගත් ඍග් වෛදික ආගම විවිධ දෙවිවරුන්ට පුද පූජා කරන විවිධ දෙවිවරුන් කලින් කලට ප්‍රමුඛත්වයේලා සලකන ආකාරය ද එයිනික්බිති ක්‍රමයෙන් දියුණුවට පත්ව දෙවියන් පිළිබඳ සැක පළ කරන ස්වභාවයට ද එක් දෙවියෙකු මුල් කරගත් ආගමික මතවාදයක් දක්වා දියුණු වූ ආගමික ලක්ෂණ ද දක්නට ලැබේ. විවිධ රැකියාවල නියුතු ඍග් වෛදික ජනයාගේ මූලික ආර්ථික සාධකය බවට පත්ව තිබුණේ කෘෂිකර්මයයි. එහිලා ගවයාට හිමිවූයේ සුවිශේෂී ස්ථානයනක් බව උක්ත තොරතුරු මඟින් පැහැදිලි වෙයි. දේශපාලනය ගත් විට රජු මූලික කරගත් තම භූමිය වැඩි දියුණු කරගැනීමට දැඩි ලෙස වෙරදරන ලද යුදවාදී දේශපාලන රටාවක් ඍග් වෛදික සමාජයේ දක්නට ලැබේ.

විශේෂයෙන් ආර්යයන් අනාර්යයන් ආක්‍රමණය කරමින් තිබූ යුගයක් ඍග්වේදය තුළ දකක්නට ලැබේ. ඒ නිසා යුදවාදී මානසිකත්වය ඍග් වෛදික ජනයාගෙන් බැහැර නොවූ බව දක්නට ලැබේ. ආර්ය අනාර්ය භේදය මත කුල භේදය දක්නට ලැබුණ ද පසුකාලයේ මෙන් ඉතා බරපතල ලෙස කුල භේදයක් ඍග් වෛදික සමාජයේ දක්නට නොලැබේ. නමුත් පසුකාලීනව ඒ සඳහා ද මූලිකාරම්භය



ඍග්වේදය තුළින් සපයන්නේ නොවේ යයි කිව නොහැකිය. විවිධ ක්‍රීඩාවල නියුතු වූ ඍග් වෛදික ජනයා සරල ජීවන රටාවකින් යුක්තව දේවත්වය මුල් කොටගත් ආගමික සදාචාරයෙන් පිරිපුන්ව ජීවත් වූ බව මෙහිලා අපට සඳහන් කළ හැකිය.

## ආන්තික සටහන්

1. ආනන්ද මෛත්‍රිහිමි බළන්ගොඩ, ''වේද සාහිත්‍යය ගැන වචනයක්'', සාධනා 02 කලාපය, (සංස්.), අඹකුඹුරේ අස්සජි, ප්‍රේමසිරි තිරිමාන්න, කැළණියඃ විද්‍යාලංකාර සංස්කෘත පර්ෂදය, 1961-62, පිටුව 24
2. එම්.වින්ටර්නීට්ස්, ඉන්දීය සාහිත්‍යය ඉතිහාසය, කොළඹඃ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1967, පිටුව 39
3. ජී.එස්.බී. සේනානායක, සංස්කෘත සාහිත්‍යය, කොළඹඃ ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, 1960, පිටුව 12
4. ජේ. තිලකසිරි, වෛදික සාහිත්‍යය, කොළඹඃ සීමාසහිත එකසත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, 1958, පිටුව 01
5. Winternitz M. A History of Indian Literature,Vol.1,part.1, (Translated from the original German by Mrs.S.Ketkar,-Third Edition), India: University of Calcutta, 1962, P 253
6. තේපාලයේ සංකිච්ච හිමි, ''ඍග්වේදය නිර්මාණය වශයෙන් භාරතීයද ? නැතහොත් ප්‍රාග් භාරතීයද?'', සුමන ප්‍රබෝධ, සංස්, සම්පත් ආරියසේන, නුගේගොඩඃ නියෝ ග්‍රැෆික්ස්, 2006, පිටුව 522
7. වී.ඩී.එස්. ගුණවර්ධන, ඉන්දියන් ඉතිහාසය පුරාතන යුගය, කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2002, පිටුව 49
8. ජේ. තිලකසිරි, එම, 1958, පිටුව 28
9. සිංහල විශ්වකෝෂය 05, සංස්, ඩී.ඊ.හෙට්ටිආරච්චි, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, 1974, පිටුව 144
10. වී.ඩී.එස්. ගුණවර්ධන, එම, 2002, පිටුව 50

11. සංකිච්ච හිමි තේපාලයේ, එම, 2006, පිටුව 523

12. පියනන්ද දික්වෙල, ''වෛදික සූක්තයෝ'', සාධනා 01, (සංස්.), පොල්ගහවෙල ධම්මපාල, විකිරිබණ්ඩා ජයසේකර, කැළණිය: විද්‍යාලංකාර සංස්කෘත පර්ෂදය, 1960-6), පිටුව 35

13. වී.ඩී.එස්. ගුණවර්ධන, එම, 2002, පිටුව 60

14. භාරතීය සංස්කෘතික ඉතිහාසය, පරවාහැර පඤ්ඤානන්ද හිමි, ඩී.ඒ. වෙදගේ, (පරි.), ලංකාණ්ඩුවේ මුද්‍රණාලය, 1959, පිටුව 21

15. RGVEDA SAMHITHA VOL; 04, N.S.Sontakke, C.G. Kashikar, (ed.), Poona: Vaidika samsodhana Mandala, Tilak Memorial, 1946, P 586

16. Ibid, P 587

17. Ibid, P 584

18. වී.ඩී.එස්. ගුණවර්ධන, එම, 2002, පිටුව 60

19. භාරතීය සංස්කෘතික ඉතිහාසය, 1959, පිටුව 22

20. නාරාවිල පැට්රික්, ඍග්වේදගීතාවලී, කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ, 1998, පිටුව 266

21. මාදුරුඔයේ ධම්මිස්සර හිමි, ''මිනිස් ජීවිතය සොබාදහම සහ ඍග්වේදයේ දෙවිවරු'', ශාස්ත්‍රීය සංග්‍රහය, සංස්, ලෙවන්ගම සරණංකර ආදීහු, ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ ප්‍රකාශන, 1998, පිටුව 108

22. සාරස්වතව්‍යාකරණම්, වාසුදේව ශර්මණ (සංස්.), බොම්බාය: නිරයසාගර මුද්‍රණාලය, 1929, පිටුව 285

23. S. Radhakrishnan, Indian Philosophy vol 01, London, 1956, P 72

24. Ibid, P 98

25. ජිනදාස කළුපහන, භාරතීය දර්ශන ඉතිහාසය, ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි, 1963, පිටුව 13



26. A.A. Macdonell, A Vedic Reader For Students , London: Oxford University Press, 1957, P 154

27. ඍග්වේදය1.139.11

28. නාරාවිල පැට්රික්, එම, 1998, පිටුව xvii

29. ජේ. තිලකසිරි, එම, 1958, පිටුව 3-4

30. RGARTHADIPIKA, Lakshman Sarup, (Ed.), Lahore: Motilal Banarsidass, Oriantel Publisher, 1939, P 05

31. Ibid, P 08

32. එම්. වින්ටර්නිට්ස්, එම, 1967, පිටුව 61

33. RGVEDA SAMHITHA VOL; 02, N.S.Sontakke, C.G. Kashikar, (Ed.), Poona: Vaidika samsodhana Mandala, Tilak Memorial, 1936, P 45

34. Ibid, P 46

35. එම්. වින්ටර්නිට්ස්, එම, 1967, පිටුව 60

36. නාරාවිල පැට්රික්, එම, 1998, පිටුව 195-196

37. එම, පිටුව 196-197

38. ඍග්වේදය 01.64.46, එබඳුම අදහස් දෙන ''ඒකං සන්තං බහුදා කල්පයන්ති'' ඍග්වේදය x.114.5

39. මාදුරුඔයේ ධම්මිස්සර හිමි, එම, 1998, පිටුව 115

40. වී.ඩී.එස්. ගුණවර්ධන, එම, 2002, පිටුව 66

41. ඩී. ජයකොඩි, ''ඍග් වෛදික යුගයේ දේශපාලන සංස්ථා හා ආර්ථික තත්ත්වය'', භාරත ලංකා ඉතිහාස විමර්ශන, සරසවි අංකය, නිමල් ආරියවංශ (සංස්.), කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ, 1966, පිටුව 127

42. ඒ.එල්. බෂාම්, අසිරිමත් ඉන්දියාව, ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය, 1965, පිටුව 43

43. භාරතීය සංස්කෘතික ඉතිහාසය, 1959, පිටුව 22

44. නරේන්ද්‍ර කෘෂ්ණ සිංහ, අනිල් චන්ද්‍ර බැනර්ජි, ඉන්දියා ඉතිහාසය 01 කාණ්ඩය, ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි, 1966, පිටුව 43

45. ජේ.ඩබ්ලිව්.ගුණතිලක, ඉන්දියා ඉතිහාසය, කොළඹ, ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, 1962, පිටුව 24

46. ඍග්.10.97.06

47. RGVEDA SAMHITHA VOL; 04, 1946, P 887

48. හිරිපිටියේ පඤ්ඤකිත්ති හිමි, පුරාතන භාරතීය රාජ්‍ය පාලන මූලධර්ම, කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ, 2001, පිටුව 07

49. RGVEDA SAMHITHA VOL; 04, 1946, P 888

50. හිරිපිටියේ පඤ්ඤකිත්ති හිමි, එම, 2001, පිටුව 07

51. ඍග්. 01.17.01

52. RGVEDA SAMHITHA VOL; 03, N.S.Sontakke, C.G. Kashikar, (Ed.), Poona: Vaidika samsodhana Mandala, Tilak Memorial, 1941, P 254

53. Ibid, P 256

54. ඍග්. 07.18.06

55. RGVEDA SAMHITHA VOL; 04, 1946, P 189

56. Ibid, P 667

57. හිරිපිටියේ පඤ්ඤකිත්ති හිමි, එම, 2001, පිටුව 06

58. නාරාවිල පැට්රික්, එම, 1998, පිටුව 203

59. භාරතීය සංස්කෘතික ඉතිහාසය, 1959, පිටුව 23